# බඳවා ගැනීමේ පටිපාටිය

සේවා ගණය :- ක්ෂේත්‍රගත/කාර්යාලගත - මණ්ඩ 2

වැටුප් කේතය :- **MN-5**

තනතුරු :- වැඩසටහන් කළමනාකරු

තත්ත්ව පාලන නිලධාරි

රා.සේ.කො. අනුමත කළ දිනය :- 2012.12.09

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවෙහි

ක්ෂේත්‍රගත/ කාර්යාලගත - ඛණ්ඩ 2 සේවා ගණය සඳහා වන

බඳවා ගැනීමේ පටිපාටිය

01. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව : ධීවර හා ජලජ සම්පත් — යොමු අංකය :ධීජදෙ/ආ02/05/බඳවා ගැනීම්/MN 5
දිනය : 2012.03.05

1.2 අමාත්‍යාංශය : ධීවර හා ජලජ සම්පත් සංවර්ධන — යොමු අංකය : 1/5/1/7/ ධීදෙ/බ.ප/සංශෝධන/MN
දිනය :

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම — යොමු අංකය :BD/356/168/66/EP දිනය : 1992.08.11
යොමු අංකය : DMS/FOR/13-10 දිනය : 2003.10.14
යොමු අංකය : DMS/C/3/36/01 දිනය : 2010.11.08

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය — යොමු අංකය :EST-3/RECRU/03/4881 දිනය : 2012.05.11

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය — යොමු අංකය :NSCC/5/36/1/SR-1 දිනය : 2012.06.11

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය — යොමු අංකය :PSC/EST/7/1/36/3/2012 දිනය :2012.12.09

02. පත් කිරීමේ බලධරයා පිළිබඳ විස්තර

2.1 පත් කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්

03. සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය : ක්ෂේත්‍රගත/ කාර්යාලගත නිලධාරී - ඛණ්ඩ 2

3.2 ශ්‍රේණි : II , I

3.3. පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

තනතුරට පැවරෙන ප්‍රධාන කාර්යභාරය වශයෙන් කිසියම් පනතක්/ ආඥා පනතක්/ ප්‍රඥප්තියක් මගින් නිල නාමයෙන් විශේෂිත කොට පවරනු ලබන බලාත්මක කිරීමේ/ නියාමනය කිරීමේ/ විධිමත් කිරීමේ නෛතික කාර්යයන් විධායක නිලධරයන්ගේ අධීක්ෂණය යටතේ පැවරෙන්නා වූද, බඳවා ගැනීමේ මූලික සුදුසුකමක් වශයෙන් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් අධ්‍යාපන සුදුසුකම් ලෙස සලකනු ලබන්නා වූද, සේවා ගණයකි.

04. තනතුරේ ස්වභාවය:- ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත.

05. වැටුප්

5.1 වැටුප් කේත අංකය : MN 5 -2006 A

5.2 වැටුප් පරිමාණය : රු.16,720 - 10x320 - 11x365 - 15x450 - 30,685/-

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාල ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | වැටුප් තලය (රු.) |
|---|---|---|
| II | පියවර 01 | රු. 16,720/= |
| I | පියවර 12 | රු. 20,285/= |

06. සේවා ගණයට අයත් තනතුර/ තනතුරු

6.1 අනුමත තනතුරු නාම හා අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්:

| අනුමත තනතුරුනාම | අනුමත තනතුරු සංඛ්‍යාව | ඒවාට පැවරෙන කාර්යයන් |
|---|---|---|
| වැඩසටහන් කළමනාකරු | 02 | i. වාර්ෂික ජාතික ධීවර සංවර්ධන සැලැස්මේ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තු කාර්ය භාරයට අදාළව සැලසුම් සකස් කිරීම, පසු විපරම් කිරීම, මාසිකව හා ත්‍රෛමාසිකව ප්‍රගති සමාලෝචනය හා ප්‍රගති වාර්තා සකස් කිරීම.<br>ii. උතුරු නැගෙනහිර ධීවර පුනරුත්ථාපන වැඩසටහන් දෙපාර්තමේන්තු මට්ටමින් ක්‍රියාත්මක කිරීම.<br>iii. ත්‍රස්ත විපත් හා ස්වභාවික විපත් වලින් විපතට පත්ව අවතැන්වන ධීවර ප්‍රජාවට සහන සැලසීම පිළිබඳ කටයුතු.<br>iv. විවිධ ව්‍යාපෘති යටතේ නිකුත් කරන ලද ධීවර යාත්‍රාවල ඉදිරි කටයුතු. (වාරික අය කිරීම, පැවරීම, රක්ෂණ කටයුතු, නීතිමය කටයුතු ආදී වශයෙන්)<br>v. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම හා පවත්වාගෙන යාම.<br>vi. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ තොරතුරු එක්රැස් කිරීම හා පවත්වාගෙන යාම.<br>vii. රාජ්‍ය ප්‍රතිපත්ති මත වරින් වර ක්‍රියාත්මක කරනු ලබන විවිධ ව්‍යාපෘතීන්ට සහයෝගය දැක්වීම.<br>viii. අවස්ථානුකූලව අධ්‍යක්ෂ ජනරාල් විසින් වරින් වර පවරනු ලබන රාජකාරි. |
| තත්ත්ව පාලන නිලධාරි | 10 | i. සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ (තත්ත්ව පාලන) යටතේ ධීවර යාත්‍රා, මසුන් වෙන්දේසි ස්ථාන, මසුන් ගොඩබාන ස්ථාන, මත්ස්‍ය ගබඩා, අපනයනය සඳහා මත්ස්‍ය නිෂ්පාදන සකස් කරන ස්ථාන හා මසුන් අලෙවි කරන ස්ථාන පරීක්ෂා කිරීම. ඒ සම්බන්ධයෙන් සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ (තත්ත්ව පාලන) වෙත වාර්තා කිරීම.<br>ii. නිල සාම්පල (අයිස්, ජලය, මසුන්, ඉස්සන් යනාදිය) ලබා ගැනීම හා ඒවා පර්යේෂණාගාර වෙත ලබා දීම. පරීක්ෂණ වාර්තා විශ්ලේෂණය කර සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ (තත්ත්ව පාලන) වෙත වාර්තා කිරීම. |

| | | |
|---|---|---|
| | | iii. ධීවර නිෂ්පාදන පරීක්ෂා කිරීමට අවශ්‍ය පරීක්ෂණාගාර අනුමත කිරීම සඳහා පරීක්ෂා කිරීම. අනුමැතියෙන් පසු අවශ්‍ය තත්ත්වයන් පවත්වාගෙන යන්නේදැයි පරීක්ෂාකර සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ (තත්ත්ව පාලන) වෙත වාර්තා කිරීම.<br>iv. ධීවර නිෂ්පාදන සඳහා නිකුත් කරනු ලබන ස්වස්ථතා සහතික අත්සන් කිරීම.<br>v. මත්ස්‍ය නිෂ්පාදනවල සෞඛ්‍යාරක්ෂිතභාවය තහවුරු කිරීමේ ක්‍රමවේදය විගණනය කිරීම.<br>vi. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙන් කරනු ලබන පරීක්ෂණ සහ විශ්ලේෂණයන් අධීක්ෂණය කිරීම.<br>vii. ජාත්‍යන්තර සම්මතයන්ට අනුකූලව හා යුරෝපා ආර්ථික කොමිසමේ නිර්ණායකයන්ට අනුව මත්ස්‍ය අපනයන කටයුතු පවත්වාගෙන යාම සම්බන්ධයෙන් අධීක්ෂණය කිරීම.<br>viii. නව තාක්ෂණය හා තත්ත්ව පාලන කළමනාකරණ ක්‍රම පිළිබඳව මත්ස්‍ය අපනයනකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.<br>ix. ඉස්සන් වගා කිරීමේ කටයුතුවල නිරත වන ප්‍රජාව සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.<br>x. සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ (තත්ත්ව පාලන) සහ අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරනු ලබන රාජකාරි. |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :

වැඩසටහන් කළමණාකරු - 02

තත්ත්ව පාලන නිලධාරි - 10

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස්කිරීමේ කාර්යය සඳහා II හා I ශ්‍රේණීන් ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

## 07. බඳවා ගැනීමේ ක්‍රමය

### 7.1 බඳවා ගැනීමේ අනුපාතය

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 50% |
| සීමිත | 50% |

7.2 විවෘත බඳවා ගැනීම :

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : II ශ්‍රේණිය

7.2.2 සුදුසුකම් :

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් :

| තනතුරේ නාමය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|
| වැඩසටහන් කළමනාකරු | අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම,<br>සහ<br>ආ) උපාධි පාඨමාලාවක ප්‍රධාන විෂයක් ලෙස ඉංග්‍රීසි විෂය සමත්වී තිබීම,<br>හෝ<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ ඉංග්‍රීසි භාෂාව විෂය සමත්වී තිබීම,<br>හෝ<br>අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව/ ඉංග්‍රීසි සාහිත්‍යය විෂයට සම්මාන සාමාර්ථය ලබා තිබීම,<br>හෝ<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය හෝ ඊට ඉහළ මට්ටමේ විභාගයක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් සමත්වී තිබීම. |
| සත්ත්ව පාලන නිලධාරී | අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ජීව විද්‍යාව, ක්ෂුද්‍ර ජීව විද්‍යාව, සත්ත්ව විද්‍යාව, රසායන විද්‍යාව, ධීවර විද්‍යාව, ආහාර විද්‍යාව, ආහාර තාක්ෂණ විද්‍යාව යන විෂයන්ගෙන් අවම වශයෙන් විෂයන් දෙකක් ඇතුළත් විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම හෝ ඉහත විෂයයන්ගෙන් අවම වශයෙන් විෂයන් දෙකකින් යුක්තව කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම,<br>සහ<br>ආ) උපාධි පාඨමාලාවක ප්‍රධාන විෂයක් ලෙස ඉංග්‍රීසි විෂය සමත්වී තිබීම,<br>හෝ<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ ඉංග්‍රීසි භාෂාව විෂය සමත්වී තිබීම,<br>හෝ<br>අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව/ ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සම්මාන සාමාර්ථය ලබා තිබීම,<br>හෝ<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය හෝ ඊට ඉහළ මට්ටමේ විභාගයක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් සමත්වී තිබීම. |

7.2.2.2 වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ.

7.2.2.3 පළපුරුද්ද : අදාළ නොවේ.

7.2.2.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් මානසික හා ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.2.2.5 වෙනත් : අයදුම්කරු,

i. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
ii. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන අවසන් දිනට ප්‍රථම සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.2.3 වයස :

7.2.3.1 අවම සීමාව : අවුරුදු 21

7.2.3.2 උපරිම සීමාව : අවුරුදු 35

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය :

7.2.4.1 ලිඛිත විභාගය -

| විෂයයන් | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය<br>2. රචනය හා සාරාංශය<br>3. සාමාන්‍ය දැනීම | පැය 01<br>පැය 01 1/2<br>පැය 01 | 100 | 40% |

(විෂය නිර්දේශය ඇමුණුම I මගින් දැක්වේ.)

7.2.4.1.1 පවත්වන බලධාරියා : ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් විභාග පැවැත්වේ.

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය - අදාළ නොවේ.

7.2.4.3 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

7.2.4.4 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය: (ලකුණු ලබා දෙනු නොලැබේ)

7.2.4.4.1 ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු : වැඩසටහන් කළමනාකරු සහ තත්ත්ව පාලන නිලධාරි යන තනතුරු වලට අදාල නිලධාරීන් බඳවා ගැනීමේදී ඔවුන්ගේ සුදුසුකම්, සහතික සහ මනා සෞඛ්‍ය තත්ත්වය පරීක්ෂා කර බැලීම සඳහා පමණි.

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළකිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළකිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.3 සීමිත බඳවා ගැනීම

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය : II ශ්‍රේණිය

7.3.2. සුදුසුකම් :

7.3.2.1 අධ්‍යාපන සුදුසුකම් :

| තනතුරු නාමය | අධ්‍යාපන සුදුසුකම් |
| --- | --- |
| වැඩසටහන් කළමනාකරු | අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම,<br>සහ<br>ආ) උපාධි පාඨමාලාවක ප්‍රධාන විෂයක් ලෙස ඉංග්‍රීසි විෂය සමත්වී තිබීම,<br>හෝ<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ ඉංග්‍රීසි භාෂාව විෂය සමත්වී තිබීම,<br>හෝ<br>අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව/ ඉංග්‍රීසි සාහිත්‍යය විෂයට සම්මාන සාමාර්ථය ලබා තිබීම,<br>හෝ<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය හෝ ඊට ඉහළ මට්ටමේ විභාගයක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් සමත්වී තිබීම. |
| තත්ත්ව පාලන නිලධාරී | අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ජීව විද්‍යාව, ක්ෂුද්‍ර ජීව විද්‍යාව, සත්ත්ව විද්‍යාව, රසායන විද්‍යාව, ධීවර විද්‍යාව, ආහාර විද්‍යාව, ආහාර තාක්ෂණ විද්‍යාව යන විෂයන්ගෙන් අවම වශයෙන් විෂයන් දෙකක් ඇතුළත් විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම හෝ ඉහත විෂයයන්ගෙන් අවම වශයෙන් විෂයන් දෙකකින් යුක්තව කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම,<br>සහ<br>ආ) උපාධි පාඨමාලාවක ප්‍රධාන විෂයක් ලෙස ඉංග්‍රීසි විෂය සමත්වී තිබීම,<br>හෝ<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ ඉංග්‍රීසි භාෂාව විෂය සමත්වී තිබීම,<br>හෝ<br>අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව/ ඉංග්‍රීසි සාහිත්‍යය විෂයට සම්මාන සාමාර්ථය ලබා තිබීම,<br>හෝ<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය හෝ ඊට ඉහළ මට්ටමේ විභාගයක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් සමත්වී තිබීම. |

7.3.2.2 වෘත්තීය සුදුසුකම් : තනතුරට අදාල වෘත්තීය සුදුසුකම් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

7.3.2.3 පළපුරුද්ද :

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ සංවර්ධන නිලධාරී සේවයේ තනතුරු වන තත්ත්ව පාලන සහකාර, ධීවර සම්පත් කළමනාකරණ සහකාර, නීති සහකාර, ගිණුම් සහකාර, තාක්ෂණ සහකාර යන තනතුරක ස්ථිර වී තිබීම සහ අදාල තනතුරේ වසර 05 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

හෝ

සංවර්ධන නිලධාරී සේවයේ තනතුරක ස්ථිර වී තිබීම සහ අදාල තනතුරේ වසර 05 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

හෝ

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ වැඩ සටහන් සහකාර තනතුරක ස්ථිර වී තිබීම සහ අදාල තනතුරේ වසර 05 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

හෝ

ධීවර පරීක්ෂක, ධීවර සමාජ සංවර්ධන සහකාර යන තනතුරක ස්ථිර වී තිබීම සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම හා උපාධිය ලබා ගැනීමෙන් අනතුරුව අදාල තනතුරේ වසර 05 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබිය යුතුය.

7.3.2.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් මානසික හා ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.3.2.5 වෙනත් : i. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

ii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ /ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන අවසන් දිනට පුර්ම සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.3.3 බඳවා ගැනීමේ ක්‍රමය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

7.3.3.1 ලිඛිත විභාගය : අදාළ නොවේ.

7.3.3.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

7.3.3.3. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය:

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීම සඳහා අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| i. | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | අදාල නොවේ. |
| ii. | වෘත්තීය සුදුසුකම් | 15 | |
| iii. | අතිරේක පළපුරුද්ද | 20 | |
| iv. | ක්ෂේත්‍රය සඳහා දායකත්වය | 15 | |
| v. | තොරතුරු තාක්ෂණය/පරිගණක විද්‍යාව පිළිබඳව ලබා ඇති සුදුසුකම් | 10 | |
| vi. | ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය | 15 | |
| vii. | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | 05 | |
| | | 100 | - |

සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලද ලකුණු අනු පිළිවෙළ අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව මත බඳවා ගැනීම සිදුකෙරේ.

7.3.3.3.1 පවත්වන බලධාරියා : ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්

7.3.3.4 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ : අදාළ නොවේ.

7.3.4 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළකිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම සහ වෙබ් අඩවියේ පළකිරීම මඟින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.4 කුසලතා මත බඳවා ගැනීම : අදාළ නොවේ.

## 08. කාර්යක්ෂමතා කඩඉම්

8.1

| තුමන කාර්යක්ෂමතා කඩඉම්ද යනවග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත/වෘත්තිය/සහතික පාඨමාලා/වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | II වන ශ්‍රේණියට බඳවාගෙන වසර තුන (03) ක් ගතවීමට පෙර | ලිඛිත |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | I වන ශ්‍රේණියට උසස්කර වසර පහ (05) ක් ගතවීමට පෙර | ලිඛිත |

විෂය නිර්දේශයන් ඇමුණුම II,III යටතේ දැක්වේ.

8.2 පරීක්ෂණ පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද? : වසරකට දෙවරක්.

8.3 කාර්යක්ෂමතා කඩඉම් වලට අදාල පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද ? :

1 වන කාර්යක්ෂමතා කඩඉම - ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් විභාග පවත්වනු ලැබේ.

2 වන කාර්යක්ෂමතා කඩඉම - ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් විභාග පවත්වනු ලැබේ.

## 09. රාජ්‍ය භාෂා ප්‍රවීණතාව

9.1

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාවය |
|---|---|
| 01. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. |
| 02. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව නියමිත මට්ටමේ භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය |

## 10. ශ්‍රේණි උසස් කිරීම

10.1 II වන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම

10.1.1 සාමාන්‍ය කාර්යය සාධනය අනුව

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

i. පත්වීම් ස්ථිර කර තිබීම.
ii. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය(10) ක් උපයාගෙන තිබීම.
iii. අනුමත කාර්යය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යය සාධනයක් පෙන්නුම් කර තිබීම.
iv. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
v. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම.
vi. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් I ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධාරියා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට, පත් කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

10.1.2 සුවිශේෂී කාර්යය සාධනය අනුව

10.1.2.1 සපුරාලිය යුතු සුදුසුකම් :

i. පත්වීම ස්ථිර කිරීම.
ii. සේවා ශ්‍රේණියේ II ශ්‍රේණියේ වසර හය (06) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක හය (06) ම නියමිත දිනට උපයාගෙන තිබීම.
iii. අනුමත කාර්යය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර හය (06) තුළම සුවිශේෂී කාර්යය සාධනයක් පෙන්නුම් කර තිබීම.
iv. උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
v. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය නියමිත කාලය තුළදී ලබාගෙන තිබීම.
vi. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් ව තිබීම.

10.1.2.2 උසස් කිරීමේ ක්‍රමය :

ඉහත සුදුසුකම් සපුරාලන නිලධරයන්ට පත්කිරීම් බලධාරියා අනුමත කරන ආයතනයක් විසින් පවත්වනු ලබන ලිඛිත අභියෝගතා පරීක්ෂණයකට පෙනී සිටිය හැක. ඉන් සමත්වන්නන් විසින් පත්කිරීම් බලධාරියා වෙත නියමිත ආකෘති පත්‍රය මඟින් ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධාරියා විසින් සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ. අදාළ සෙසු අවශ්‍යතාවන් ද සම්පූර්ණ කර ඇති නිලධරයන් පත්වීමේ දින සිට වසර හයක් (06ක්) සම්පූර්ණ වන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.
(අභියෝගතා පරීක්ෂණයෙහි විෂය නිර්දේශය ඇමුණුම VI යටතේ දැක්වේ.)

සංලක්ෂය :

1. සුවිශේෂී කාර්යසාධනය ඇගයීමේ ක්‍රමවේදයක් රජය විසින් හඳුන්වාදී ක්‍රියාත්මක කරන තෙක්, දැනට ක්‍රියාත්මක වන වාර්ෂික කාර්ය සාධන ඇගයීමේදී සතුටුදායක මට්ටම හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කරනු ලැබ ඇති නිලධාරීන්ට සුවිශේෂී කාර්යසාධනය යටතේ උසස් කිරීම් සඳහා වන ලිඛිත අභියෝගතා පරීක්ෂණය සඳහා පෙනී සිටීමට අවස්ථාව සලසා දෙනු ලැබේ.

2. සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේ දී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීමේ දිනය කාර්යක්ෂමතා කඩඉම් සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

11. තනතුරු වලට පත් කිරීම - අදාල නොවේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි : අදාල නොවේ

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති වල දැක්වෙන අර්ථ නිරූපන වලට පරිබාහිරව වන්නා වූ අර්ථ නිරූපන : සක්‍රිය සේවා කාලය යනු ස්වකිය තනතුරට අදාල වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

14. මෙම බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින නිලධාරීන් නව ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීම ඇමුණුම V මගින් දැක්වේ.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පරිපාටික රීති වල දැක්වෙන කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාල වේ.

16. මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වේතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

සකස් කලේ :- අත්සන : ..............................
(විෂය භාර සහකාර මාණ්ඩලික නිලධරයා)

නම :
තනතුර :
දිනය : 2012.12.26

පරීක්ෂා කලේ :- අත්සන ..............................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නමු. ඩී. එස්. සේනානි සෙනෙවිරත්න
තනතුර : සහකාර අධ්‍යක්ෂ (පාලන)
දිනය : ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

නිර්දේශ කර ඉදිරිපත්කරමි.

අත්සන : ..............................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම :
තනතුර :
දිනය : 28/12/2012
නිල මුද්‍රාව : නිමල් හෙට්ටිආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

යොමු අංකය : 1/5/1/7/[illegible]

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවෙහි ක්ෂේත්‍රගත/ කාර්යාලගත - ඛණ්ඩ 02 සේවා ගණයට අදාල තනතුරු සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

ආචාර්ය දමිතා ද සොයිසා
ලේකම්
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
නව මහලේකම් කාර්යාලය
මාලිගාවත්ත, කොළඹ - 10.

අත්සන : ..............................................

නම : ආචාර්ය දමිතා ද සොයිසා

ලේකම්

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

දිනය : ........................

නිල මුද්‍රාව : ..............................................

---

යොමු අංකය : PSC/EST/7/1/36/2/2012

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවෙහි ක්ෂේත්‍රගත/ කාර්යාලගත - ඛණ්ඩ 02 සේවා ගණයට අදාල තනතුරු සඳහා වන මෙම බඳවා ගැනීමේ පටිපාටිය 2012.12.09 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදි.

අත්සන : ..............................................

නම : ..............................................

ලේකම් : ..............................................

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2013.02.01

නිල මුද්‍රාව : ඩී. එම්. එල්. බී. සේනාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 177, නාවල පාර, නාරාහේන්පිට
කොළඹ 05.

(06)

ඇමුණුම I

## විභාග පිළිබඳ ආකෘතිය

01. විභාගය / පරීක්ෂණය පිළිබඳ විස්තර : ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවෙහි ක්ෂේත්‍රගත/ කාර්යාලගත - ඛණ්ඩ 2 සේවා ගණයට අදාල තනතුරු සඳහා වන විවෘත බඳවා ගැනීම සඳහා වූ ලිඛිත පරීක්ෂණය පිළිබඳ ආකෘතිය.

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| රචනය හා සාරාංශය | පැය 01 1/2 | 100 | 40% |
| සාමාන්‍ය දැනීම | පැය 01 | 100 | 40% |

02. පවත්වනු ලබන බලධරයා : ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් විභාග පවත්වනු ලැබේ.

03. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 01. බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ තර්කානුකූල විවරණ සහ විග්‍රහ ශක්තිය හා නිවැරදිව සිද්ධි අනුමානයන්ට එළඹීමේ හැකියාව, සාමාන්‍ය දැනුම හා බුද්ධිය පිළිබඳව මැනීම අරමුණු කොට ගෙන මෙය සම්පාදනය කරනු ලැබේ. මෙය ගණිත ගැටළු, සාමාන්‍ය දැනීම, පරිසරය හා ආශ්‍රිත ප්‍රශ්න ඇතුලත් බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. |
| 02. රචනය හා සාරාංශය | කාලීන සමාජීය සිදුවීමක් පිළිබඳ ප්‍රකාශයක් හෝ සාකච්ඡා සටහනක් කියවා අවබෝධකොට ගෙන විග්‍රහ කර දැක්වීම පිළිබඳ හැකියාව මැනීම හා රචනය/ සාරාංශකරණය කිරීමේ හැකියාව මැනීම පිළිබඳ ප්‍රශ්න පත්‍රයකි. |
| 03. සාමාන්‍ය දැනීම | ශ්‍රී ලංකාවේ මෙන්ම ලෝකයේ මූලය, ආර්ථික, වාණිජ, දේශපාලන, ජාත්‍යන්තර සබඳතා, කළමනාකරණ,විද්‍යා හා තාක්ෂණ, අධ්‍යාපන, සෞඛ්‍ය, ක්‍රීඩා, පරිසර, සමාජ හා සංස්කෘතික යන ක්ෂේත්‍රයන්හි වැදගත් සිද්ධීන් ද, අදාලව විශේෂයෙන් දේශීය හා විදේශීය ධීවර ක්ෂේත්‍රය පිළිබඳ මූලික දැනීම මැන බැලීම සඳහා සකස් කරනු ලබන ප්‍රශ්න කිහිපයකට පිළිතුරු සැපයීම අපේක්ෂා කරනු ලැබේ. |

අත්සන : ..................
(විෂයභාර සභාපති මාණ්ඩලික නිලධාරී)
නම :
තනතුර:
දිනය: 2012.12.26

අත්සන : ..................
(විෂයභාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරී)
නම :
තනතුර:
දිනය:

අත්සන : ..................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම :
තනතුර :
දිනය : 28/12/2012
නිල මුද්‍රාව :

නිමල් හෙට්ටිආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

ඇමුණුම II

## විභාග පිළිබඳ ආකෘතිය

01 විභාගයේ / පරීක්ෂණයේ නම : ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/ කාර්යාලගත - ඛණ්ඩ 2 සේවා ගණයේ නිලධාරීන් සඳහා වන 1 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය.

02. විභාගය / පරීක්ෂණය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ආයතනික කාර්ය පටිපාටි I | පැය 2 | 100 | 40% |
| මුදල් රෙගුලාසි | පැය 1 | 100 | 40% |

03.පවත්වනු ලබන බලධරයා : ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් විභාග පවත්වනු ලැබේ.

04.විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන බව : වසරකට දෙවරක්.

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 01. ආයතනික කාර්ය පටිපාටි I | 1. ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද <br> ආයතන සංග්‍රහයේ I කාණ්ඩය ඇසුරින් : <br> පරිච්ඡේද I, II, IV, V, VII, IX, XV, XXIII, XXVI, XXVII, XXX, XXXI, XXXII, XXXIII <br> 2. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ . <br> පරිච්ඡේද III, XII, XIII, XIV, XV, XVI, XVII |
| 02.මුදල් රෙගුලාසි | 1. මුදල් රෙගුලාසි සංග්‍රහයේ I වන ඛාණ්ඩයේ I සිට IX දක්වා <br> 2. රජයේ ප්‍රසම්පාදන කාර්ය පටිපාටිය පිළිබඳ සාමාන්‍ය දැනීම. |

සකස් කළේ :

අත්සන : ..............................

(විෂයභාර කනිෂ්ඨ මාණ්ඩලික නිලධාරි)

නම : [illegible]

තනතුර: [illegible]

දිනය: 2012.12.26

පරීක්ෂා කළේ :

අත්සන : ..............................

(විෂයභාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරි) සහකාර අධ්‍යක්ෂ (පාලන)

නම :

තනතුර: ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

දිනය:

අත්සන : ..............................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම :

තනතුර :

දිනය : 28/12/2012

නිල මුද්‍රාව : නිමල් හෙට්ටිආරච්චි අධ්‍යක්ෂ ජනරාල් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

ඇමුණුම III

## විභාග පිළිබඳ ආකෘතිය

01. විභාගයේ / පරීක්ෂණයේ නම : ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/ කාර්යාලගත ශ්‍රේණිය 2 සේවා ගණයේ නිලධාරීන් සඳහා වන 2 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

02. විභාගය / පරීක්ෂණය පිළිබඳ විස්තර :

| තනතුර | ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| වැඩ සටහන් කළමනාකරු | 1) ආයතනික කාර්ය පටිපාටි II<br>2) ව්‍යාපෘති කළමනාකරණය. | පැය 02<br>පැය 01 | 100 | 40% |
| තත්ත්ව පාලන නිලධාරී | 1) ආයතනික කාර්ය පටිපාටි II<br>2) මත්ස්‍ය අපනයනය පිළිබඳ දේශීය හා ජාත්‍යන්තර රෙගුලාසි. | පැය 02<br>පැය 01 | 100 | 40% |

03. පවත්වනු ලබන බලධරයා : ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් විභාග පවත්වනු ලැබේ.

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන බව : වසරකට දෙවරක්.

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| තනතුර | ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|---|
| වැඩ සටහන් කළමනාකරු | 1) ආයතනික කාර්ය පටිපාටි II | 1) ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව හා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය මගින් වරින් වර නිකුත් කර ඇති සියළුම වලංගු නියෝග චක්‍රලේඛ හා උපදෙස් පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම. |
| | 2) ව්‍යාපෘති කළමනාකරණය. | 2) ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පවත්වනු ලබන ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ පාඨමාලාවට අනුව පහත සඳහන් මාතෘකා යටතේ දැනුම පරීක්ෂා කිරීම.<br>I. ව්‍යාපෘතිය හඳුනා ගැනීම සහ ව්‍යාපෘති චක්‍ර<br>II. ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබාගැනීම සහ අරමුදල් සපයා ගැනීම<br>III. ව්‍යාපෘතිවල ශක්‍යතා අධ්‍යයනය.<br>IV. ව්‍යාපෘති වාර්තා , වැඩ සැලැස්ම හා ඇස්තමේන්තු පිළියෙල කිරීම<br>V. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම, ඇගයීම ව්‍යාපෘති හා සම්බන්ධිත ප්‍රසම්පාදන ක්‍රියා විධිය. |
| තත්ත්ව පාලන නිලධාරී | 1) ආයතනික කාර්ය පටිපාටි II | 1) ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව හා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය මගින් වරින් වර නිකුත් කර ඇති සියළුම වලංගු නියෝග, චක්‍රලේඛ හා උපදෙස් පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම. |

| | | |
|---|---|---|
| | 2) මත්ස්‍ය අපනයනය පිළිබඳ දේශීය හා ජාත්‍යන්තර රෙගුලාසි. | 2) මසුන් පරිහරණය හා පසු අස්වනු තාක්ෂණය, මත්ස්‍ය නිෂ්පාදන වල ගුණාත්මක භාවය හා ඒ කෙරෙහි බලපාන සාධක, මත්ස්‍ය නිෂ්පාදනයන්හි ගුණාත්මක භාවය තහවුරු කරන නවීනතම ක්‍රමවේද, අපනයන මත්ස්‍ය නිෂ්පාදන තත්ත්ව කළමනාකරණයට අදාල රෙගුලාසින්, දේශීය වෙළඳපල සඳහා මසුන් පරිහරණය කිරීමේ හා බෙදාහැරීමේ නියෝග. |

සකස් කළේ :

අත්සන : ..............................

(විෂයභාර කනිෂ්ඨ මාණ්ඩලික නිලධාරී)

නම :

තනතුර:

දිනය: 2012.12.26

පරීක්ෂා කළේ :

අත්සන : ..............................

(විෂයභාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරී)

නම :

තනතුර: ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

දිනය:

අත්සන : ..............................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම :

තනතුර :

දිනය : 28/12/2012

නිල මුද්‍රාව :

නිමල් හෙට්ටිආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

ඇමුණුම IV

## විභාග/පරීක්ෂණ පිළිබඳ විස්තර

01. විභාගයේ/පරීක්ෂණයේ නම : ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/ කාර්යාලගත - ඛණ්ඩ 2 සේවා ගණයේ නිලධාරීන් සඳහා වන සුවිශේෂී කාර්යය සාධනය යටතේ උසස්වීම් සඳහා වන විභාගය

02. විභාගය/පරීක්ෂණය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| අභියෝගතා පරීක්ෂණය | පැය 1 1/2 | 100 | 60% |

03. පවත්වනු ලබන බලධරයා : ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් විභාග පවත්වනු ලැබේ.

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට එක් වරක් පවත්වන අතර නිලධරයෙකුට පෙනී සිටිය හැක්කේ ද එක් වරක් පමණි.

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| අභියෝගතා පරීක්ෂණය | තමා වෙත පැවරෙන සියලු කාර්යයන් සාමාන්‍ය කාර්යක්ෂමතා මට්ටම ඉක්මවූ කාර්යක්ෂමතාවයකින් යුතුව ඉටු කිරීම සඳහා අවශ්‍ය වන දැනුම, කුසලතා හා ආකල්ප මෙන්ම අපේක්ෂිත ප්‍රවණතාවන් අත්පත් කර ගෙන තිබේද යන්න මැන බැලීමේ ලිඛිත අභියෝගතා පරීක්ෂණයකි. |

සකස් කළේ :

අත්සන : ..................

(විෂයභාර සහකාර මාණ්ඩලික නිලධාරී)

නම :

තනතුර:

දිනය: 2012.12.26

පරීක්ෂා කළේ :

අත්සන : ..................

(විෂයභාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරී)

නම : යූ. වී. එස්. සේනානි සෙනෙවිරත්න
සහකාර අධ්‍යක්ෂ (පාලන)
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

තනතුර:

දිනය:

අත්සන : ..................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම :

තනතුර :

දිනය : 27/12/2012

නිල මුද්‍රාව :

නිමල් හෙට්ටිආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

<u>ඇමුණුම V</u>

**<u>මෙම බඳවාගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින වැඩසටහන් කළමනාකරු සහ තත්ත්ව පාලන නිලධාරී යන නිලධාරීන් නව ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීම.</u>**

නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006(IV) මඟින් ලබා දී ඇති MN 5-2006 "ඒ" වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නිලධාරීන් සියළු දෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 වගන්තියේ සඳහන් වැටුප් පරිවර්තන ක්‍රමවේදය අනුව පහත සඳහන් පරිදි ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. සේවා කාලය ගණන්ගත යුත්තේ ඒ ඒ තනතුරට පත් කරන ලද දිනය පදනම් කර ගෙනය. කෙසේ වුවද, අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර, එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබීම ද නොකළ යුතුය.

<u>MN 5 - II ශ්‍රේණිය</u>

(අ) MN 5-2006 "ඒ" වැටුප් පරිමාණය යටතේ II වන ශ්‍රේණියට අදාළ වැටුප් නියම කර ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10 ක සේවා කාලයක් සම්පූර්ණ කර නැති නිලධාරීන්,

(ආ) II වන ශ්‍රේණියට අදාළ වැටුප් නියම කර ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10 ක සේවා කාලයක් සම්පූර්ණ වුවද I වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම සඳහා අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන්,

MN 5 - II වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

<u>MN 5 - I ශ්‍රේණිය</u>

(අ) ඉහත සඳහන් පරිදි II වන ශ්‍රේණියට අදාළ වැටුප් නියම කර ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10කට නොඅඩු එහෙත් අවුරුදු 20කට අඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුල අවම වශයෙන් වැටුප් වර්ධක දහය(10)ක් උපයා ගෙන ඇති හා නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වීමට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිලධාරීන්,

MN 5 - I වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

සකස් කළේ :
අත්සන: ..............................
(විෂයභාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරී)
නම :
තනතුර :
දිනය : 2012.12.26

පරීක්ෂා කළේ :
අත්සන: ..............................
(විෂයභාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරී)
නම :
තනතුර :
දිනය :
සහකාර අධ්‍යක්ෂ (පාලන)
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

අත්සන : ..............................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම :-
තනතුර :-
දිනය :
නිල මුද්‍රාව :-
හිමල් හෙට්ටිආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

ඇමුණුම අංක 01

(19)

| | |
|---|---|
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011 2136600<br>011 2136650<br>011 2136700 |
| ලේකම්<br>செயலாளர்<br>Secretary | 011 2136602 |
| ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011 2369302<br>011 2369305 |
| විද්‍යුත් තැපෑල<br>மின்னஞ்சல்<br>E-mail | sec-psc@sltnet.lk |
| වෙබ් අඩවිය<br>இணையத்தளம்<br>Website | www.psc.gov.lk |

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.
இல. 177, நாவல வீதி, நாரஹேன்பிட்ட, கொழும்பு 05.
No. 177, Nawala Road, Narahenpita, Colombo 05.

| | |
|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | PSC/EST/8/5/8/2013 |
| ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | 2/1/17/2/09 |
| දිනය<br>திகதி<br>Date | 2013 ඔක්තෝබර් මස [illegible] දින |

ලේකම්,
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය.

**<u>ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ විධායක සේවා ශ්‍රේණිය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය සඳහා ධීවර සම්පත් කළමනාකරණ සහකාර සහ තත්ත්ව පාලන සහකාර තනතුරු ඇතුළත් නොකිරීම සම්බන්ධවයි.</u>**

උක්ත කරුණ සම්බන්ධ ඔබේ සමාංක හා 2013/06/28 දිනැති ලිපිය හා බැඳේ.

02. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත සේවා ශ්‍රේණියට අයත් නිලධාරීන් හට දෙපාර්තමේන්තුගත තනතුරු සඳහා අයදුම් කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ පහත පරිදි වේ.

I. MN-05-2006 A වැටුප් පරිමාණය යටතේ තත්ත්ව පාලන නිලධාරී තනතුර සඳහා අනුමත කරන ලද බඳවා ගැනීමේ පටිපාටියේ 7.3.2.3 වගන්තිය මේ සමඟ අමුණා ඇති සංශෝධන ලැයිස්තුවේ සඳහන් පරිදි සංශෝධනය කිරීමට.

II. විධායක සේවා ශ්‍රේණිය සඳහා සීමිත ධාරාව යටතේ බඳවා ගැනීමේදී දෙපාර්තමේන්තුවේ සේවය කරන ආශ්‍රිත සේවා ශ්‍රේණියට අයත් නිලධාරීන් හට සහකාර අධ්‍යක්ෂ තනතුරට අයදුම්කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධව කර ඇති ඉල්ලීම සලකා බැලිය නොහැකි බව.

එම්.ඩී.ජේ. ප්‍රසාද්
සහකාර ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

පිටපත -
01. අධ්‍යක්ෂ ජනරාල්, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව - අවශ්‍ය කටයුතු සඳහා.

සංශෝධිත උපලේඛනය

| වගන්තිය | දැනට පවතින ආකාරය | සංශෝධිත විය යුතු ආකාරය |
|---|---|---|
| 7.1.2.3 | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ සංවර්ධන නිලධාරී සේවයේ තනතුරු වන සත්ව පාලන සහකාර,ධීවර සම්පත් කළමනාකරණ සහකාර,නීති සහකාර, ශිල්පීය සහකාර, තාක්ෂණ සහකාර යන තනතුරක ස්ථිර වී තිබීම සහ අදාල තනතුරේ වසර 05 ක සක්‍රිය හා සතුටුදායක සේවාකාලයක් සපුරා තිබීම<br>හෝ<br>සංවර්ධන නිලධාරී සේවයේ තනතුරක ස්ථිර වී තිබීම සහ අදාල තනතුරේ වසර 05 ක සක්‍රිය හා සතුටුදායක සේවාකාලයක් සපුරා තිබීම<br>හෝ<br>ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ වැඩසටහන් සහකාර තනතුරක ස්ථිර වී තිබීම සහ අදාල තනතුරේ වසර 05 ක සක්‍රිය හා සතුටුදායක සේවාකාලයක් සපුරා තිබීම<br>හෝ<br>ධීවර පරීක්ෂක,ධීවර සමාජ සංවර්ධන සහකාර යන තනතුරක ස්ථිර වී තිබීම සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබාතිබීම හා උපාධිය ලබාගැනීමෙන් අනතුරුව අදාල තනතුරේ වසර 05 ක සක්‍රිය හා සතුටුදායක සේවාකාලයක් සපුරා තිබිය යුතුය. | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ සංවර්ධන නිලධාරී සේවයට අයත් [redacted] තනතුරු වන සත්ව පාලන සහකාර,ධීවර සම්පත් කළමනාකරණ සහකාර,නීති සහකාර, ශිල්පීය සහකාර, තාක්ෂණ සහකාර යන තනතුරක ස්ථිර වී තිබීම සහ අදාල තනතුරේ වසර 05 ක සක්‍රිය හා සතුටුදායක සේවාකාලයක් සපුරා තිබීම<br>හෝ<br>සංවර්ධන නිලධාරී සේවයට [redacted] අයත් තනතුරක ස්ථිර වී තිබීම සහ අදාල තනතුරේ වසර 05 ක සක්‍රිය හා සතුටුදායක සේවාකාලයක් සපුරා තිබීම<br>හෝ<br>ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ වැඩසටහන් සහකාර තනතුරක ස්ථිර වී තිබීම සහ අදාල තනතුරේ වසර 05 ක සක්‍රිය හා සතුටුදායක සේවාකාලයක් සපුරා තිබීම<br>හෝ<br>ධීවර පරීක්ෂක,ධීවර සමාජ සංවර්ධන සහකාර යන තනතුරක ස්ථිර වී තිබීම සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබාතිබීම හා උපාධිය ලබාගැනීමෙන් අනතුරුව අදාල තනතුරේ වසර 05 ක සක්‍රිය හා සතුටුදායක සේවාකාලයක් සපුරා තිබිය යුතුය. |

දුරකථන / தொலைபேசி / Telephone: 011-2136600, 011-2136650, 011-2136700
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2369302, 011-2369305
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail: sec-psc@sltnet.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: PSC/EST/7/1/36/3/201

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2014.01.23

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.
இல. 177, நாவல வீதி, நாரஹேன்பிட்ட, கொழும்பு 05.
No. 177, Nawala Road, Narahenpita, Colombo 05.

27 JAN 2014

ලේකම්,

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය,

**<u>MN 5 – 2006 A වැටුප් කේතය යටතේ වන ව්‍යාපෘති කළමනාකරු තනතුරේ බඳවා ගැනීම.</u>**

උක්ත කරුණ හා සම්බන්ධ ඔබේ සමාංක හා 2013.12.09 දිනැති ලිපිය හා බැඳේ.

02. එම ලිපියේ සඳහන් කරුණු සලකා බැලූ රාජ්‍ය සේවා කොමිෂන් සභාව, ව්‍යාපෘති කළමනාකරු තනතුර සඳහා 100% ක් සීමිත පදනමින් බඳවා ගැනීමට හැකිවන පරිදි, එම කොමිෂන් සභාව විසින් 2012.12.09 දින අනුමත කරන ලද ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත / කාර්යාලගත - මණ්ඩ 2 සේවා ගණයේ (MN 5 – 2006 A) බඳවා ගැනීමේ පරිපාටිය පහත වගුවෙහි දැක්වෙන පරිදි සංශෝධනය කිරීම, 2014.01.21 දින අනුමත කර ඇති බව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය පරිදි කාරුණිකව දන්වමි.

| අනු අංකය | දැනට පවත්නා මෙළ | සංශෝධනය විය යුතු ආකාරය |
|---|---|---|
| 1. | 7.1 බඳවා ගැනීමේ අනුපාතය<br>ධාරාව / ප්‍රතිශතය<br>විවෘත / 50%<br>සීමිත / 50% | 7.1 බඳවා ගැනීමේ ප්‍රතිශතය<br>7.1.1 ව්‍යාපෘති කළමනාකරු<br>ධාරාව / ප්‍රතිශතය<br>සීමිත / 100% |
| 2. | 7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් ඇතුලත් වගුවේ ව්‍යාපෘති කළමනාකරු තනතුරට අදාළ කොටස | සම්පූර්ණයෙන්ම ඉවත් විය යුතුය. |
| 3. | 7.2.4.4.1 හි | "ව්‍යාපෘති කළමනාකරු සහ" යන කොටස ඉවත් විය යුතුය. |

එම්.පී.පී.සිල්වා
සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

පිටපත් - 01. ලේකම්, ජාතික වැටුප් කොමිෂන් සභාව
02. ආයතන අධ්‍යක්ෂ ජනරාල්
03. අධ්‍යක්ෂ ජනරාල්, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

ජ්‍යෙෂ්ඨ අංශ 03


011-2136606
011-2136650

011-2136602

011-2876169
011-2876181

info@psc.gov.lk

www.psc.gov.lk

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
No. 1200/9, Rajamalwatta Road, Battaramulla.


මගේ අංකය / எனது இல. / My No. PSC/EST/7/1736/2012

ඔබේ අංකය / உமது இல. / Your No. 1/5/1/7/2/.../MN 5 (II)

දිනය / திகதி / Date 2020.06.02

ලේකම්

ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය

<u>ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ රා.ප.චක්‍රලේඛ 06/2006 (IV) අනුව (MN-5-2006 A) වැටුප් කාණ්ඩය යටතේ ඇති ව්‍යාපෘති කළමණාකරු හා තත්ත්ව පාලන නිලධාරී යන තනතුර සඳහා බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කිරීම</u>

උක්ත කරුණ සම්බන්ධව ඔබේ අංක හා 2019.12.23 දිනැති ලිපිය හා බැඳේ.

02. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2012.12.09 දින අනුමත කරන ලද හා 2014.01.21 දිනැතිව සංශෝධනය කරන ලද ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවෙහි ක්ෂේත්‍රගත/කාර්යාලගත - ඛණ්ඩ 2 සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියට මේ සමඟ ඇති ඇමුණුම් අංක 01 හි සඳහන් සංශෝධනයන් එක් කිරීමට <u>රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2020.05.21 වන දින තීරණය</u> කර ඇති බව එම කොමිෂන් සභාවේ නියමය පරිදි කාරුණිකව දන්වමි.

03. මේ පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, මෙම බඳවා ගැනීමේ පටිපාටියට එක් කරන ලද සංශෝධනයන් ඔබ අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළ කරන ලෙසත් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

අත්/කළේ: ආර්.ඩී.පී.එස්. ධර්මසේන

ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන)

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ

ලේකම් වෙනුවට

පිටපත්: 1) ලේකම් - ජාතික වැටුප් කොමිෂන් සභාව

2) අධ්‍යක්ෂ ජනරාල්- ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

3) ආයතන අධ්‍යක්ෂ ජනරාල්

සංශෝධන ලැයිස්තුව

ඇමුණුම 01

| අනු අංකය | ඡේද අංකය | සංශෝධන විය යුතු ආකාරය |
|---|---|---|
| 1. | 1.6 | යොමු අංකය :PSC/EST/7/1/36/3/2012 දිනය: 2012.12.09<br><br>01 වන සංශෝධිත දිනය :2014.01.21<br>02 වන සංශෝධිත දිනය :.................<br>(දිනය සඳහන් කරන්න) |
| 2. | 7.3.2.3<br>පළපුරුද්ද | (අ) ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ<br>ධීවර නිලධාරි<br>හෝ<br>ධීවර සම්පත් කළමනාකරණ සහකාර<br>හෝ<br>නීති සහකාර<br>හෝ<br>වැඩ සටහන් සහකාර<br><br>යන තනතුරක ස්ථිර වී තිබීම සහ<br>අදාළ තනතුරේ වසර 05 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම<br>හෝ<br>(ආ) ධීවර දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු සංවර්ධන නිලධාරි සේවයට හෝ ආශ්‍රිත නිලධාරි සේවා ගණයට අයත් තනතුරක එම දෙපාර්තමේන්තුව තුළ වසර 05 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සහිතව සේවයේ ස්ථිර කරන ලද නිලධාරීන් වීම<br><br>හෝ<br>(ඇ) ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ධීවර පරීක්ෂක<br><br>හෝ<br><br>ධීවර සමාජ සංවර්ධන සහකාර<br><br>හෝ<br><br>යන තනතුරක ස්ථිර වී තිබීම හා අදාළ තනතුරේ වසර 05 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම<br><br>ලෙස සංශෝධනය කරන්න. |